සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 50 S I,II

නම: ............................................ | නාට්‍ය හා රංගකලාව I | කාලය පැය එකයි

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ සැසඳෙන කවය තුළ කතිර සළකුණ (x) යොදන්න.

◆ පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ ඇසුරු කරගනිමින් අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A පයින් අවිදිල්ල මහන්සිද මන්දා
ගොඩින් පැනගත්ත හුගක් ළඟ හින්දා

B උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම්තැන්නෙන් ගෙනාවා
කපා කොටා ලියවාලා ගෙනාවා
රිද්දි බිසව් හිස පීරන පනාවා

C රතදර සිරියා පරදන
රූපෙට වටිනා
නිමල කොමළ තරුණී

D ගුරුන්නාන්සේ - දොඩවන භාෂාවක් නැද්ද කියලයි අහන්නේ
බමුණා - දේව භාසායන් අත්ථි බහු මනුස්සානං අත්ථි

E හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනි
නට නටා වරෙව්

01) පුන්‍යසේන ගුණසිංහගේ නාට්‍යයකට අයිති ගීතයක් වන්නේ,
1. A 2. B 3. C 4. D

02) දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍යයකට අයත් ගීත සංවාදයක් වන්නේ,
1.A 2. B 3. C 4. E

03) පහතරට රටයකුම ශාන්තිකර්මයේ එන කවියකි.
1. A 2. B 3. C 4' D

04) නව නාට්‍ය ගීතයක් වන්නේ,
1. A 2. B 3. D 4. E

◆ **නිවැරදි පිළිතුර තෝරන්න.**

05) නාට්‍ය කලාව සෙසු ප්‍රාසාංගික කලාවන්ගෙන් වෙනස් වන්නේ පහත සඳහන් කුමන අංගයක් යොදා ගන්නා බැවින් ද?
1. රංගාලෝකය 2. වේශ භූෂණ 3. රංග භූමි අලංකරණය 4. සතර අභිනය

06) නෘත්‍ය යනු,
1. යම්කිසි අර්ථයක් දැක්වෙන තාලාන්විත නැටුමකි.
2. අංග වික්ෂේපයක් පමණක් ඇති තාලාන්විත නැටුමකි.
3. කිසියම් භාව ප්‍රකාශනයක් රහිත තාලානුකුල හා රිද්මයානුකුල නැටුමකි.
4. කිසියම් කතා පුවතක් නිරූපණය කරන රැඟුම් විශේෂයකි.

07) ප්‍රාසාංගික කලා පමණක් අඩංගු වරණය තෝරන්න.
1. වේදිකා නාට්‍ය, බැලේ, ඔපෙරා, චිත්‍ර ප්‍රදර්ශන
2. චිත්‍රපට දර්ශන, සංගීත සන්දර්ශන, ඔපෙරා, ඉඟිනළු
3. නර්තන සන්දර්ශන, බැලේ නාට්‍ය, සංගීත සන්දර්ශන, ඔපෙරා
4. ඔපෙරා, වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය, මුද්‍රා නාට්‍ය

08) සංවාද, අංගචලන, භාව ප්‍රකාශන, වේශභූෂණවලට අදාළ අභින සතර පිළිවෙලින් වන්නේ,
1. වාචික, සාත්වික, ආංගික, ආහාර්ය
2. වාචික, ආංගික, සාත්වික, ආහාර්ය
3. ආහාර්ය, ආංගික, සාත්වික, වාචික
4. වාචික, ආංගික, ආහාර්ය, සාත්වික

09) නාට්‍ය පෙළක නළුවන් සඳහා සපයනු ලබන උපදෙස් වන්නේ,
1. පෙළ මතක් කර දීමයි. 2. රංග විධානයි 3. විස්තර කථනයයි. 4. රංග රචනයයි

10) නූතන සිංහල නාට්‍ය කලාවේ සන්දිස්ථානය සනිටුහන් වන්නේ කවර නාට්‍යය බිහිවීමෙන් පසුවද?
1. සුභ සහ යස 2. කුවේණි 3. මනමේ 4. ජනේලය

11) නිර්මිත චලන යනු,
1. පරිකල්පනය මෙහෙයවා උත්පාදනය කරන්නකි.
2. පෙර පුහුණුවීම් වලින් ඉගෙන ගන්නා කාර්යයකි.
3. රංග අභ්‍යාස මගින් පුහුණු කරනු ලබන්නකි.
4. නිශ්චිත රටාවකට අනුව කරන චලනයකි.

12) විවිධ සෙල්ලම් බඩු කිහිපයක් ගෙන සිසුන්ගේ දෑස් වසා එම භාණ්ඩය හඳුනා ගැනීමට සලසයි. මෙය,
1. සිරුර සම්බන්ධ සන්වේදන අභ්‍යාසයකි.
2. මනස සම්බන්ධ සන්වේදන අභ්‍යාසයකි.
3. දිව සම්බන්ධ සන්වේදන අභ්‍යාසයකි.
4. ඇස පිළිබඳ සන්වේදන අභ්‍යාසයකි.

13) කය සහ මනස සැහැල්ලු කර ගැනීම සඳහා යොදා ගත හැකි රංග අභ්‍යාස වන්නේ,
1. කටහඬ අභ්‍යාස
2. ශ්වසන අභ්‍යාස
3. තාපන අභ්‍යාස
4. ශිථිලකරණ අභ්‍යාස

14) දර්පන අභ්‍යාසවල යෙදීමෙන් නළුවාට,
1. සංවාද උච්චාරණයට පහසු වේ.
2. සෘජු දෑස් අතර සම්බන්ධතාවය ඇතිකර ගත හැක.
3. මනස සැහැල්ලු කරගත හැක.
4. සබකෝලය දුරුකර ගත හැක.

15) ක්ෂණික නිරූපණයක්....
1. පිටපතක් අනුව ඉදිරිපත් කරයි.
2. දීර්ඝ කාලීන පුහුණුවකින් ඉදිරිපත් කරයි.
3. දෙන ලද ඉඟියකට අනුව පරිකල්පනය මෙහෙයවා ඉදිරිපත් කරයි.
4. වාචික අභිනය භාවිතයෙන් තොරව ඉදිරිපත් කරයි.

16) නාට්‍ය කලාවේ ලක්ෂණයකි.
1. එක් කාලවේලාවක් තුළ ස්ථාන කීපයක රඟ දැක්වීම.
2 සජීවීව ඉදිරිපත් කරන කලාවක් වීම.
3 නැවත නැවත නිර්මාණය වෙනස් කිරීමට නොහැකි වීම.
4 අවකාශ භාවිතය සීමා රහිත වීම.

17) වේදිකා නාට්‍ය හා සෘජු සබඳතාවයක් නොමැති කලා මාධ්‍යය වන්නේ,
1. සිනමාව 2 .සංගීතය 3. නර්තනය 4 . චිත්‍ර කලාව

- පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 18 සිට 21 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| • අන්දර මල් | • මනාලයෝ | • සෝෂක වස්තුව | • බෝඩිංකාරයෝ |
| • චරන්දාස් | • වැදගත්කම | • දියසෙන් නොපැමිණීම | • එකවල්ලේ පොල් |
| • කල්පාන්තර | • ඇත්ත කුමක්ද | • ස්වර්ණපාලි | • තට්ටු ගෙවල් |
| • මැටි කරත්තය | • අහස් මාළිගා | • බෙරහඬ | • හිත හොඳ අම්මණ්ඩි |
| ක | ග | ජ | ඩ |

18) "ක" තීරුවේ නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවා වන්නේ,
1. සුගතපාල ද සිල්වා 2. බන්දුල ජයවර්ධන 3 .පරාක්‍රම නිරිඇල්ල 4. හෙන්රි ජයසේන

19) "ග" තීරුවේ නාට්‍ය නිර්මාණය කළ නිර්මාණකරුවා වන්නේ,
1. සයිමන් නවගත්තේගම 2.දයානන්ද ගුණවර්ධන 3. ගුණසේන ගලප්පත්ති 4. හෙන්රි ජයසේන

20) "ජ" තීරුවේ නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවා වන්නේ,
1. බන්දුල ජයවර්ධන 2. සයිමන් නවගත්තේගම 3. සුගතපාලද සිල්වා 4. දයානන්ද ගුණවර්ධන

21) "ඩ" තීරුවේ නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවා වන්නේ,
1. එදිරිවීර සරච්චන්ද්‍ර 2.පරාක්‍රම නිරිඇල්ල 3. සුගතපාලද සිල්වා 4. බන්දුල ජයවර්ධන

22) නාට්‍ය පෙළක් රචනා කිරීමේදී වැදගත් නොවන්නේ,
1 මුල, මැද, අග සහිතව පිළිවෙලින් රචනා විය යුතුය.
2 ගැටුම් අවස්ථා නාට්‍ය අවසානයේදී නිරාකරණය කළ යුතුය.
3 චරිත රංගවිධාන හා සංවාද නිරවුල් විය යුතුය.
4 නාට්‍ය ගීත වැඩි ප්‍රමාණයක් පෙළ තුළ තිබිය යුතුය.

23) නූතන රංග භූමිය මනඃකල්පිතව බෙදා ඇති කොටස් ගණන කීයද?
1. පහයි 2. නවයයි 3. අටයි 4. දහයයි

24) "වඩිග පටුන" නැමැති නාට්‍යයමය අවස්ථාව අන්තර්ගත ශාන්තිකර්මය වන්නේ,
1. රටයකුම 2. දහඅට සන්නිය 3. සූනියම් ශාන්තිය 4. දෙවොල් මඩුව

25) නාට්‍ය රචකයා විසින් ලියන ලද නාට්‍ය පෙළ සජීවී කලාවක් ලෙසට ප්‍රේක්ෂකයා වෙතට ගෙන යාමට මූලික වන්නේ,
1. නාට්‍ය අධ්‍යක්ෂක 2. නළු නිළියන් 3. අර්ථපති 4. වේදිකා පරිපාලක

26) ලෝක ධර්මී නාට්‍ය සම්බන්ධව වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. මෙම නාට්‍ය වේදිකා සැරසිලි වලින් තොරය.
2. බොහෝ විට කාලීන පුවතක් පාදක කරගනී.
3. රංගනය සඳහා සංගීතය අත්‍යවශ්‍ය අංගයකි.
4. ඇඳුම් පැළඳුම් අතිශයෝක්තියෙන් යුක්තව නිර්මාණය කෙරේ.

- පහත දැක්වෙන ඡායාරූප අතරින් අංක 27 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A B C D E

27) නාට්‍ය හා රංගකලාව විෂය පාසල් විෂයක් ලෙස විෂය මාලාවට එක් කිරීමට පුරෝගාමී වූ නාට්‍යකරුවා,
1. A 2. B 3. C 4. E

28) ශෛලිගත සම්ප්‍රදාය ඇසුරුකර ගනිමින් "ජනේලය" නාට්‍ය තුළින් සමකාලීන ගැටලුවක් සාකච්ඡා කළ නාට්‍යකරුවා වන්නේ,
1. A 2. B 3. C 4. D

29) රතු හැට්ටකාරි, තාරාවෝ ඉගිලෙති නාට්‍ය වලට රංගනයෙන් දායක වුණු රංගන ශිල්පිනිය වන්නේ,
1. A 2. B 3. C 4. D

30) ජනකරලිය නම් ජංගම නාට්‍ය රංග පීඨයක් හඳුන්වා දුන් නාට්‍යකරුවා වන්නේ,
1. A 2. B 3. C 4. E

31) නාට්‍යයක් රඟ දක්වන විට අනිවාර්යයෙන්ම සිටිය යුත්තේ කවුරුන්ද?
1. නාට්‍ය අධ්‍යක්ෂ, නළු නිළියන් 2. නළු නිළියන්, ප්‍රේක්ෂකයින්
3. වේදිකා පරිපාලක, සහය ශිල්පීන් 4. ගායන ශිල්පීන්, නළු නිළියන්

◆ පහත දැක්වෙන පද අතරින් නොගැළපෙන පදය තෝරන්න.

32) 1. දරු නැලවිල්ල 2. කපුයක්කාරිය 3. නානුමුරය 4. වඩිග පටුන

33) 1. දොරකඩ අස්න 2. මිලින්ද ප්‍රශ්නය 3. සූනියම් යාගය 4. ආලවක දමනය

34) 1. භයවීම 2. දහඩිය දැමීම 3. වෙව්ලීම 4. දිවීම

35) 1. රංග භූමිය 2. සංවාද 3. චරිත 4. රංගවිධාන

36) අභිනය යන්නෙහි අර්ථය වන්නේ,
1. නාට්‍ය පිටපතක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීමකි.
2. නාට්‍ය ශාස්ත්‍රයට අයත් සංකල්පයකි.
3. ඉදිරියට පැමිණවීමකි.
4 . අනුශාංගික කලාවන්ගෙන් යුක්ත වූවකි.

37) නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණයක් වන්නේ,
1. චරිත අතර සංවාද භාවිතය.
2. සාමූහික රංගන ඇතුළත් වීම.
3. අනුශාංගික කලාංග භාවිතා කිරීම.
4. චරිත අතර ගැටුමක් ඇතිවීම.

38) පහත නිර්මාණ අතුරින් වේදිකා නාට්‍යයක් නොවන්නේ,
1. ජනේලය 2. බෙරහඬ 3. සිරිපැරකුම් 4. කුවේණි

39) නාට්‍ය කලාවේ ලක්ෂණයක් නොවන්නේ,
1. රංගාලෝකය භාවිතා කරයි.
2. ගබඩා කොට තබාගත හැකියි.
3. වේදිකාවක රඟ දක්වයි.
4. සෘජු ප්‍රේක්ෂක සහභාගිත්වය සිදුවේ.

40) රූපණ ශිල්පියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ශිල්ප ක්‍රම දෙක වන්නේ,
1. අභ්‍යන්තර ප්‍රකාශන හා වාචික ප්‍රකාශන
2. අභ්‍යන්තර ප්‍රකාශන හා සාත්වික ප්‍රකාශන
3. අභ්‍යන්තර ප්‍රකාශන හා බාහිර ප්‍රකාශන
4. බාහිර ප්‍රකාශන හා ශාරීරික ප්‍රකාශන

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 50 S I,II

නම: ............................................ | **නාට්‍ය හා රංගකලාව II** | කාලය පැය දෙකයි.

◆ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) i. දික්තල කාලගෝල නාට්‍යයට වස්තු විෂය වූ ජාතක කතාව නම් කරන්න.
ii. දික්තල කාලගෝල නාට්‍යයේ රචකයා නම් කරන්න.
iii. දික්තල කාලගෝල නාට්‍යයේ චරිත හතරක් නම් කරන්න.
iv. එහි ශෛලිය හා සම්ප්‍රදාය නම් කරන්න.
v. කාලගෝල නාට්‍යයේ තේමාව කෙටියෙන් දක්වන්න.
vi. දික්තලා කාලගෝලට අකමැති වීමට හේතු 02ක් ලියන්න. (2 x 6 =12)

02) i. නාට්‍යමය ලක්ෂණ ඇතුළත් පහතරට ශාන්තිකර්ම දෙකක් නම් කරන්න. (ල.2)
ii. නම් කරන ලද ශාන්තිකර්මවල දක්නට ලැබෙන නාට්‍යයමය අවස්ථා හතරක් නම් කරන්න. (ල.4)
iii. ඉන් එක් නාට්‍යයමය අවස්ථාවක දැකිය හැකි නාට්‍යයමය ලක්ෂණ විස්තර කරන්න. (ල.6)

03) i. නෘත්ත, නෘත්‍ය නාට්‍ය සංකල්ප මුල්ම වරට හඳුන්වා දුන්නේ කවුරුන් විසින් කුමන ග්‍රන්ථයේද? (ල.2)
ii. නෘත්ත හා නෘත්‍යයට අදාළව නර්තන අංග දෙක බැගින් ලියා දක්වන්න. (ල.4)
iii. නෘත්ත, නෘත්‍ය නාට්‍යය සංකල්ප අතරින් නාට්‍ය කලාව සුවිශේෂී වන්නේ ඇයි දැයි විස්තර කරන්න. (ල.6)

04) i. අංග රචනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.2)
ii. අංග රචනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය හා උපකරණ දෙක බැගින් නම් කරන්න. (ල.4)
iii. නාට්‍යයක් රංගගත කිරීමේදී අංග රචනය නළුවෙකුට අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ල.6)

05) නළුවෙකුට හෝ නිළියකට තම නළු කාර්යය සාර්ථක කරගැනීම සඳහා රංග අභ්‍යාස ඉතා වැදගත් වේ.
i. රංග අභ්‍යාස යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.2)
ii. රංග අභ්‍යාස හතරක් නම් කරන්න. (ල.4)
iii. රංග අභ්‍යාසවල යෙදීමෙන් රූපණ ශිල්පියෙකු ලබාගන්නා ප්‍රයෝජන සාකච්ඡා කරන්න. (ල.6)

06) i. දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කරන්න. (ල.2)
ii. නම්කරන ලද නාට්‍යකරුවන්ගේ නාට්‍ය දෙක බැගින් ලියා දක්වන්න. (ල.4)
iii. ඉන් එක් නාට්‍යකරුවෙක්ගෙන් දේශීය නාට්‍ය කලාවට සිදුවූ සේවය අගයන්න. (ල.6)

◆ පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

07) 'එදින අන්දර විල ගමේ ඉරිදා පොළ දවසකි. සමන් කිරි අම්මා සමඟ නිතර කීර විකිණීමට පොළට ගියේය. ඉගෙනීමට දක්ෂ සමන්ගේ පාසල් යාම ටිකෙන් ටික අඩුවෙන්නට විය. දිනක් සමන් පොළේ කීර විකුණමින් සිටින විට කීර ගැනීම සඳහා පන්ති භාර ගුරුතුමිය එතනට පැමිණියාය.....''

i. නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම (ල.4)
ii. සංවාද, රංග විධාන සහිතව පෙළ රචනය (ල.4)
iii. චරිතය අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩනැගීම සඳහා (ල.4)